මගේ අංකය:-ED/02/03/02/07/(VI)
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව,
අංක 353,
කෝට්ටේ පාර,
රාජගිරිය .
2022.10..14

**ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන සුරාබදු පරීක්ෂක තනතුරට උසස් කිරීම සඳහා ඉල්ලුම්පත් කැඳවීම - 2022**

සුරාබදු දෙපාර්තමේන්තුවේ 2022.09.22 වන දිනට පුරප්පාඩු වී ඇති ප්‍රධාන සුරාබදු පරීක්ෂක තනතුරු 21 ක් සඳහා සාමාන්‍ය කාර්යය සාධනය මත ශ්‍රේණි උසස් කිරීම මගින් සුදුස්සන් තෝරා ගැනීම පිණිස, අයදුම්පත් කැඳවනු ලැබේ. මේ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2018.01.18 වන දින අනුමත කරන ලද සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු මහ සැරයන්, සුරාබදු පරීක්ෂක හා ප්‍රධාන සුරාබදු පරීක්ෂක තනතුරු සඳහා වන ***බඳවා ගැනීමේ පරිපාටියේ 10.1.1.1 අනුව සුදුසුකම් ලත්, දෙපාර්තමේන්තුවේ සුරාබදු පරීක්ෂකවරුන්ට*** අයදුම්පත් ඉදිරිපත් කළ හැක.

02. ඒ අනුව සුදුසුකම් සපුරා ඇති, සුරාබදු පරීක්ෂකවරුන් තම අයදුම්පත් දෙපිටපතකින් සකසා එක් පිටපතක් සහකාර සුරාබදු කොමසාරිස් මගින් ද, අනෙක් පිටපත ඍජුව ද ***2022 නොවැම්බර් මස 14 වන දිනට හෝ ඊට පෙර*** ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් පමණක් යොමු කළ යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ***"ප්‍රධාන සුරාබදු පරීක්ෂක තනතුර සඳහා අයදුම්පත"*** යනුවෙන් සඳහන් කළ යුතු අතර නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සුරාබදු කොමසාරිස් ජනරාල්,
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව,
අංක 353,
කෝට්ටේ පාර,
රාජගිරිය .

03. සපුරාලිය යුතු සුදුසුකම්:-

1. සුරාබදු පරීක්ෂක තනතුරෙහි ස්ථිරකර තිබීම.
2. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත්ව තිබීම.
3. උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට සුරාබදු පරීක්ෂකවරයෙකු වශයෙන් වසර අටක (08) සේවා කාලයක් සපුරා තිබීම.
4. අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර පහ (05) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම්කර තිබීම.
5. ඉල්ලුම් කරන දිනයේ සිට පූර්වාසන්න වසර පහ (05) ක කාලය තුළ දී සියලුම වැටුප් වර්ධක නියමිත දිනට උපයාගෙන තිබීම.
6. උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර පහ (05) තුල ( අවවාද කිරීමක් හැර) විනයානුකූල දඬුවමකට භාජනය වී නොතිබිය යුතුය.

04. යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබාදීමේ ක්‍රමය

1. **ජ්‍යෙෂ්ඨතාවය** - ලකුණු 60

සුරාබදු පරීක්ෂක තනතුරේ මුල් සතුටුදායක සේවා කාලය වසර 05 න් පසුව රා.ප.ච. 01/2019 අනුව

2. **කුසලතාවය** - ලකුණු 35

(I) පසුගිය වසර 5 තුල කාර්ය සාධන ඇගයීම් සඳහා -ලකුණු 20

ඒ අනුව එක් වර්ෂයක් සඳහා

| | |
|---|---|
| විශිෂ්ඨ | -ලකුණු 04 |
| සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහල | -ලකුණු 03 |
| සතුටුදායක | -ලකුණු 01 |

(II) ප්‍රශංසා -ලකුණු 10

(පසුගිය වසර 5 තුල ලබාගත්)

| | |
|---|---|
| විශිෂ්ඨ සේවා ඇගයීම් | -ලකුණු 05 |
| විශේෂ සාධු සටහන් | -ලකුණු 04 |
| සාධු සටහන් | -ලකුණු 02 |

3. **සම්මුඛ පරීක්ෂණය** -ලකුණු 05

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2018.01.18 වන දින අනුමත කරන ලද සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු මහ සැරයන්, සුරාබදු පරීක්ෂක හා ප්‍රධාන සුරාබදු පරීක්ෂක තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියේ 10.1.1.2 අනුව_යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගන්නා ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙල මත පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරුවලට බඳවා ගනු ලැබේ.

05. වැටුප් පරිමාණය

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව වැටුප් කේතය RS 5 – 2016 වේ. ඒ අනුව තනතුරට හිමි වැටුප් පරිමාණය රු. 42,425 - 775x17 - 55,600 (මාසික)

06. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි

1. මෙම තනතුර ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත වේ.

2. දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට නියම කරනු ලැබිය හැකිය.

3. මෙම තනතුරට පත්ව වසර තුනක් (03) ගතවීමට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතුය. (වාචික පරීක්ෂණයකි.)

| විෂය | විෂය නිර්දේශය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 01. උසාවි රාජකාරී, කාර්යාල පරිපාලනය සහ මුදල් රෙගුලාසි | උසාවි රාජකාරී, කාර්යාල පරිපාලනය සහ මුදල් රෙගුලාසි සහ රජයේ සැපයුම් ක්‍රියාවලිය පිළිබඳ දැනුම මැන බලනු ලැබේ. | 100 | 40 |

07. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්යය පටිපාටික රීති වල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාල වේ.

එම්. ජේ. ගුණසිරි
සුරාබදු කොමසාරිස් ජනරාල්
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
අංක: 353, කෝට්ටේ පාර, රාජගිරිය

එම්.ජේ. ගුණසිරි
සුරාබදු කොමසාරිස් ජනරාල්.